




# එන්න, මා පසුපස එන්න—මෙල්කිසදෙක් පූජකවරය සහ සහන සමිතිය සඳහා

ශුභාරංචිය පුස්තකාලය නමැති පරිගණක යෙදවුමෙහි සහ comefollowme.lds.org. හි පහත සඳහන් මූලාශ්‍ර සොයන්න.

# මොකක්ද වෙනස්?

මේ මෑත දවස්වල, දෙවියන්වහන්සේ තම කාර්‍යය ඉටුකිරීමට උපකාරවීම සඳහා පූජකවරය නැවත පිහිටුවා පූජකවරයේ ගණපූර්ණයන් සහ සහන සමිතිය සංවිධානය කර ඇතිසේක. (මෝසස් 1:39 බලන්න). එමනිසා සෑම ඉරිදාම අප මෙලිකිසදෙක් පූජකවරයේ සහ සහන සමිතියේ රැස්වීම්වලදී එක්කාසු වෙනවිට අප එසේ රැස්වෙන්නේ උන්වහන්සේගේ සැලැස්ම අප ඉටුකරන්නේ කෙසේද කියා සාකච්ඡා කර සැලැසුම් කිරීම සඳහාය. මේ රැස්වීම් පංතිවලට වඩා වැඩි දෙයක් විය යුත්තේ ඒ නිසාය. ඒවා ගැලවීමේ කටයුත්ත පිළිබඳව උපදෙස් ලැබීමට, එම කටයුත්ත පිළිබඳව සහා නායකයින්ගේ ඉගැන්වීම්වලින් ඉගෙනගතහැකි දේ ඉගෙනගැනීමට හා එම සැලැස්ම ඉටු කිරීමට අවස්ථා ද වේ.

## මාසික වැඩසටහනක්

ඉරිදා මෙල්කිසදෙක් පූජකවරයේ සහ සහන සමිතියේ රැස්වීම් පහත සඳහන් මාසික වැඩසටහන අනුව පැවැත්වේ:

| සතිය | පරමාර්ථය |
|---|---|
| පළවෙනි ඉරිදා | ප්‍රාදේශීය මට්ටමේ වගකීම්, අවස්ථා සහ අභියෝගයන් ගැන එකාබද්ධව උපදෙස් විමසා ක්‍රියාකිරීමට සැලසුම් කරන්න. |
| දෙවෙනි හා තුන්වෙනි ඉරිදාවල් | සභාපතිත්වය විසින් හෝ කණ්ඩායම් නායකයින් විසින් හෝ සමහර අවස්ථාවල්වලදී සභානායකවරයා හෝ ස්ටේකයේ සභාපතිවරයා විසින් තෝරාගනුලැබූ මෑත ප්‍රධාන සම්මන්ත්‍රණ පණිවිඩ අධ්‍යයනය කරන්න. |
| හතරවෙනි ඉරිදා | පළවෙනි සභාපතිත්වය විසින් හෝ ප්‍රේරිතයින් දොළොසේදනාගේ ගණපූර්ණයෙන් තෝරාගනුලැබූ විශේෂ මාතෘකාවක් සාකච්ඡා කරන්න. |
| පස්වෙනි ඉරිදා | සභානායකත්වය විසින් තෝරාගනුලැබූ මාතෘකාවක් සාකච්ඡාවට ගන්න. |

## අපගේ රැස්වීම්වලට රටාවක්

අපගේ සෑම මෙල්කිසදෙක් පූජකවර හා සහ සමිති රැස්වීමකදීම දෙවියන්වහන්සේගේ වැඩය ඉටුකිරීම සඳහා රටාවක් අප අනුගමනය කරනවා.

1. (සභාපතිත්වයේ සාමාජිකයකු හෝ කණ්ඩායම් නායකයකුගේ මූලිකත්වයෙන්) කලින් පැවති පූජකත්ව හෝ සහන සමිති රැස්විම්වලදී කාවැදුණු හෝ ලැබුණු ආරාධනාවන්වල ප්‍රතිඵල වශයෙන් ඇති වූ *අත්දැකීම් බෙදාගන්න*.
2. (පළවෙනි ඉරිදා, සභාපතිත්වයේ සාමාජිකයකු හෝ කණ්ඩායම් නායකයකුගේ මූලිකත්වයෙන්) *ඒකාබද්ධව උපදෙස් විමසන්න* නැතහොත් (දෙවෙනි, තුන්වෙනි සහ හතරවෙනි ඉරිදාවල්වලදී කැඳවනු ලැබූ ගුරුවරයකුගේ මූලිකත්වයෙන්) එකාබද්ධව ඉගෙනගන්න.
3. (සභාපතිත්වයේ සාමාජිකයකු හෝ කණ්ඩායම් නායකයකුගේ මූලිකත්වයෙන්) කණ්ඩායමක් ලෙස හෝ පුද්ගලයින් ලෙස හෝ ක්‍රියාකිරීමට සැලසුම් කරන්න.





## පළවෙනි ඉරිදා මන්ත්‍රණ සහා රැස්වීම්

සෑම මාසයේම පළවෙනි ඉරිදා, ගණපූර්ණ, කණ්ඩායම් සහ සහන සමිති රැස්වීම් ගුරුවරයකු විසින් උගන්වනු ලබන පාඩමක් ඇතුලත් නොවේ. ඒ වෙනුවට, සභාපතිත්වයන් හෝ කණ්ඩායම් නායකයින් මන්ත්‍රණ සහා රැස්වීමක් මෙහෙයවනු ඇත. සෑම ගණපූර්ණයම, හෝ කණ්ඩායමම හෝ සහන සමිතියම ප්‍රාදේශීය මට්ටමේ වගකීම්, අවස්ථා සහ අභියෝගයන් ගැන එකාබද්ධව උපදෙස් විමසනු ඇත; සෑම එක්කෙනාගේම අවබෝධයන් හා අත්දැකීම්වලින් ඉගෙනගනු ඇත; එමෙන්ම ආත්මයාණන්වහන්සේගෙන් ලැබුණු දැනීම මත ක්‍රියාකිරීමේ විදි සැලසුම් කරනු ඇත.

### මන්ත්‍රණ සහා රැස්වීමට කලින්

- නායකයෝ ප්‍රාදේශීය මට්ටමේ වගකීම්, අවස්ථා සහ අභියෝගයන් හඳුනාගෙන යාච්ඤාපූර්වකව සාකච්ඡා කිරීමට මාතෘකාවක් තෝරාගනිති.
- සෑම එක්කෙනාම ආත්මයාණන්ගේ මගපෙන්වීම සොයයි.
- සෑම එක්කෙනාම සිතුවිලි හා අත්දැකීම් බෙදාගන්න සූදානම් වෙයි.

### මන්ත්‍රණ සහා අතරතුර

- නායකයෝ කලින් රැස්වීම්වලදී ඔවුහු ලද අවබෝධය මත කටයුතු කරමින් තමන්ගේ අත්දැකීම් බෙදාගන්නා ලෙස සාමාජිකයින්ට ආරාධනා කරති.
- සෑම එක්කෙනාම මාතෘකාව ගැන ඒකාබද්ධව උපදෙස් විමසයි, එකිනෙකාට ඇහුම්කන් දෙයි, තවද ආත්මයාණන්වහන්සේගේ මගපෙන්වීම සොයයි.
- නායකයෝ ප්‍රධාන කරුණු සාරාංශ කර ක්‍රියා කරන්න කියා ආරාධනා කරති.

### සම්මන්ත්‍රණ සහා රැස්වීමට පසු

- සෑම එක්කෙනාව ඒකාබද්ධව හා පුද්ගලයින් ලෙස අවබෝධය හා ආරධනා මත ක්‍රියාකරයි.
- සෑම එක්කෙනාම තමන්ගේ අත්දැකීම් ඉදිරි රැස්වීම්වල බෙදාගන්න සූදානම් වෙයි.

"එලිදරව්ව අප අතර විසිරී ඇත" [1]

වැඩිහිටි නීල් එල්. ඇන්ඩර්සන්



"අප උන්වහන්සේගේ අත් වෙමු" [2]

සභාපති ඩියෙටර් එෆ්. උච්ට්ඩෝර්ෆ්

**සටහන්**

1. නීල් එල්. ඇන්ඩර්සන්, "අත්පොත් පුහුනුව ගැලවීමේ කාර්‍යය අවධාරනය කරයි", එන්සයින් හෝ ලියහෝනා, අප්‍රේල් 2011, 76.
2. ඩියෙටර් එෆ්. උච්ට්ඩෝර්ෆ්, "ඔබ මගේ අත් වන්නහුය", එන්සයින් හෝ ලියහෝනා, මැයි 2010, 68.

## ඒකාබද්ධව උපදෙස් විමසීමේ මූලධර්ම

සියලුම මන්ත්‍රණසභා රැස්වීම් එකවගේ නොපෙනේ. ස්වාමින්වහන්සේ ඔබට උගන්වනසේක්වා. පටන්ගන්න මූලධර්ම කීපයක් පහත දැක්වේ:

1. මන්ත්‍රණ සභාවක පරමාර්ථය ප්‍රාදේශීය මට්ටමේ වගකීම්, අවස්ථා සහ අභියෝගයන් ගැන එකාබද්ධව උපදෙස් විමසීමය; සෑම එක්කෙනාගේම අවබෝධයන් හා අත්දැකීම්වලින් ඉගෙනගනීමය; එමෙන්ම ආත්මයාණන්වහන්සේගෙන් ලැබුණු දැනීම මත ක්‍රියාකිරීමේ විදි සැලසුම් කිරීමය.
2. මන්ත්‍රණසභාවක් ක්‍රියාවට තුඩු දිය යුතුයි - ස්වාමින්වහන්සේගේ වැඩය ඉටුකිරීමට රැස්වීමෙන් පරිබාහිරව කටයුතු කිරීමට ආත්මයාණන්වහන්සේ විසින් පොලොඹවනු ලැබූ පුද්ගල හා කණ්ඩායම් සැලසුම් (ද. හා. ගි. 43:8-9 බලන්න).
3. මන්ත්‍රණ සභාව සාකච්ඡාවට මග පෙන්වන්න සහ සහාය වෙන්න ශුද්ධලියවිලි සහ මෑත දවස් අනාගතවක්තෘන්ගේ ප්‍රේරිතයන්ගේ සහ අනිකුත් ප්‍රධාන අධිකාරිවරුන්ගේ සහ ප්‍රධාන නිලධරයන්ගේ වචන භාවිතා කළ යුතුය.
4. සාකච්ඡා පුද්ගල සාමාජිකයින් හෝ පවුල් පිළිබඳ රහස්‍ය හෝ අනුවේදනීය ප්‍රශ්න ආශ්‍රිත නොවිය යුතුයි.
5. මන්ත්‍රණසභා රැස්වීම සභාපතිත්වයේ සාමාජිකයකු විසින් හෝ කණ්ඩායම් නායකත්වය විසින් මෙහෙයවනුලැබුවත්, ඔහු හෝ ඇය බෙදාගැනීම බලපෑමෙන් නොහැසිරවිය යුතුයි.
6. කිසිම කෙනෙකුට සහභාගි වීමට පීඩනය කරනු ලබනවා යයි දැනෙනවා නොවිය යුතුයි. සෑම එක්කෙනාම විවේචනය කරනු ලබන්න ඉඩ ඇත යන බියෙන් තොරව අනුවීකා හා අදහස් බෙදාගන්න ආරක්ෂා සහිතබව දැනෙන තත්ත්වයක් පැවතිය යුතුයි.
7. හැකි තැන්වල, වටේට වාඩි වීම බෙදාගැනීමේ හා විවෘත සාකච්ඡාවක හැඟීමක් (ආත්මයක්) දියණු පමුණු කිරීමට උපකාර විය හැකිය.

## පළවෙනි ඉරිදා මන්ත්‍රණ සභා රැස්වීම් සඳහා තෝරාගතහැකි මාතෘකාවන්

මන්ත්‍රණසභාවේ සාකච්ඡා කිරීමේ මාතෘකාවන් සඳහා අදහස් කොට්ඨාශ මන්ත්‍රණසභාව, සභාපතිත්ව රැස්වීම්, ප්‍රාදේශීය සැලැස්ම, සාමාජිකයින්ට සේවය කිරීම පිළිබඳ නායකයාගේ අවබෝධය සහ ශුද්ධාත්මයාණන්වහන්සේගේ මගපෙන්වීම් ආදියෙන් පැමිණෙන්න පුලුවන්.

- අපට අපගේ සියලු විවිධ වගකීම් වඩා හොඳින් ප්‍රමුඛතා ගතකළ හැක්කේ කෙසේද?
- අපට දෙවියන්වහන්සේට වැඩියෙන් ළං වීමට හා අපගේ ජීවිතවල් වලදී හා අපගේ නිවෙස්වල ආත්මයාණන්වහන්සේගෙන් වැඩියෙන් මගපෙන්වීම ලබාගත හැක්කේ කෙසේද?
- අපි ශුභාරංචිය අපගේ යහලුවන් හා අසල්වැසියන් සමඟ බෙදාගන්නේ කෙසේද? (ඇල්මා 17 බලන්න)
- අපට අපව හා අපගේ පවුල් නොහොබිනා මාධ්‍ය හා අසභ්‍ය දර්ශනවලින් ආරක්ෂා කළ හැක්කේ කෙසේද? (ද. හා ගි. 42:22-23)
- අපගේ කොට්ඨාශයේ දරුවන් හා තරුණයින්ට මගපෙන්වන්ට හා ශක්තිමත් කරන්න අපි කුමක් කරමුද?
- අපි අපගේ ගණපූර්ණයේ, කණ්ඩායමේ හෝ සහන සමිතියේ එකමතුකම වැඩිකරන්නේ කෙසේද? (මොසායා 18:19-22 බලන්න).
- අපි පවුල් ඉතිහාස වැඩෙහි හා දේවමාලිගා වන්දනාවෙහි වැඩියෙන් නියුක්ත විය හැක්කේ කෙසේද?
- අප අපගේ ප්‍රශ්නවලට පිළිතුරු හා ශුභාරංචිය පිළිබඳව වඩා ගැඹුරු අවබොධයක් සොයන අතරවාරයේදි ස්වාමින්වහන්සේගේ ආධාරයට ආරාධනා කරන්නේ කෙසේද?
- දෙමව්පියන්ට නිවසෙහි වඩා හොඳ නායකයින් විය හැක්කේ කෙසේද?
- අපට ස්වාමින්වහන්සේගේ හා උන්වහන්සේගේ ශුභාරංචිය පිළිබඳව අපගේ ශාක්ෂිය ශක්තිමත් කරමින් අපගේ පවුල්වලට උදව් කළහැක්කේ කෙසේද?
- මෙහෙවර කරනවා කියන්නේ කුමක්ද? අප අප අවට ඉන්න අයට මෙහෙවර කරන්නේ කෙසේද? (1 පේත්‍රුස් 4:11 බලන්න).



හැකිනම් සාමාජිකයින්ට මාතෘකාව ගැන සාකච්ඡා කරන්න සූදානම් වෙලා එන පිණිස නායකයින්ට පුලුවන් මාතෘකාව සාමාජිකයින්ට මාතෘකාව කලින් දන්වන්න.



## දෙවෙනි හා තුන්වෙනි ඉරිදා රැස්වීම්

සෑම මාසයේම දෙවෙනි හා තුන්වෙනි ඉරිදාවල්වල, මෙල්කිසෙදෙක් පූජකවරයේ ගණපූර්ණයන් හා සහන සමිති, මෑතම ප්‍රධාන සම්මන්ත්‍රණයෙන් ජීවමාන අනාගතවක්තෘවරුන්, ප්‍රේරිතයන් සහ අනික් සභා නායකයින්ගේ ඉගැන්වීම් අධ්‍යයනය කරති. **මෑතම සම්මන්ත්‍රණයේ ඕනෑම පණිවිඩයක් සාකච්ඡා කළ හැක.** සභා නායකත්වය දායකත්වය දුන්නත් බොහෝ අවස්ථාවල්වලදී, ගණපූර්ණ සභාපතිත්වය, කණ්ඩායම් නායකත්වය හෝ සහන සමිති සභාපතිත්වය සාමාජිකයින්ගේ අවශ්‍යතාවයන් මත පදනම් වී සම්මන්ත්‍රණයේ පණිවිඩයක් තෝරති. නායකයින්ට පළවෙනි ඉරිදා මන්ත්‍රණසභා රැස්වීමෙහි සාකච්ඡා කරනලද මාතෘකාවට සම්බන්ධ පණිවිඩයක් හෝ ආත්මයාණන්වහන්සේගේ ආනුභාවය මත පදනම්වී වෙනත් පණිවිඩයක් තේරිය හැක. නායකයින් සහ ගුරුවරු සාමජිකයින් තමන්ගේ අවබෝධයන් බෙදාගැනීමට සූදානමින් එන පිණිස තෝරාගන්නාලද පණිවිඩයන් කියවා එන්න ඔවුන්ව දිරිගැන්විමේ මාර්ග සොයාගත යුතුයි. ගැලවුම්කරුවාණන්වහන්සේගේ ආකාරයේ ඉගැන්වීමේ මූලධර්ම මත පදනම්වූ යෝජිත පහත සඳහන් ක්‍රියාකාරකම් ප්‍රධාන සම්මන්ත්‍රණ පණිවිඩයන් වලින් ඉගෙනගැනීම කෙරෙහි සාමාජිකයින්ව නිමග්න කරවිය හැකිය.

**ෂැරොන් එයුබෑන්ක්**, "ඔබගේ ආලෝකය විවෘත කරන්න"

එක් දැහැමි හා විශ්වාසවන්ත කාන්තාවක් විසින් තමන්ගේ ජීවිතවල් කුමන ආකාරයට හොඳ බවට හරවනු ලැබ තිබෙනවාද කියා සිතන්න කියා ඔබගේ ගණපූර්ණයේ හෝ සහන සමිතියේ සාමාජිකයින්ට කියන්න. එයුබෑන්ක් සොයුරියගේ පණිවිඩයෙහි විස්තර කර ඇති දැහැමි කාන්තාවන්ගේ ලක්ෂණ එකක් හෝ වැඩිගනනක් මේ කාන්තාව නිරූපනය කරන්නේ කෙසේද කියා බෙදාගන්න කියා සාමාජිකයින් ස්වල්ප දෙනෙකුට ආරාධනා කරන්න සිතන්න. අවසාන දවස්වල සභාවේ සංඛ්‍යාමය හා ආධ්‍යාත්මික වර්ධනයෙහි අපට සැලකිය යුතු බලවේගයක් බවට පත්විය හැක්කේ කෙසේද යන්න ගැන අපට එයුබෑන්ක් සොයුරියගෙන් ඉගෙනගතහැක්කේ කුමක්ද?

**නීල් එෆ්. මැරියොට්**, "දෙවියන්වහන්සේ තුල ජීවත්වීම සහ කඩකිරීම හරිගස්සා ගැනීම"

මෙම පණිවිඩය සාමාජිකයින්ට උපකාර කළ හැකිය. ඔබ උගන්වන අය කඩකිරීමක් කියන්නේ කුමක්ද කියා තේරුම්ගන්න කුමක් උපකාරිවෙයිද? ඔබට විවිධ ආකාරයේ කඩකිරීම් පිලිබඳ පින්තූරු ගෙන එන්න පුලුවන්. මැරියොට් සොයුරිය කඩකිරීම නිර්වචනය කරන්නේ කෙසේද? දෙවියන්වහන්සේ සමඟ හෝ අනික් අය සමඟ වන අපගේ සම්බන්ධතාවයන්වල කඩකිරීම් ඇති කළ හැක්කේ කුමකටද? අපගේ ජීවිතවල්වලදී කඩකිරීම් ඇති කළ හැක්කේ කුමකටද යන්න පිළිබඳව යෝජනාවල් සඳහා මැරියොට් සොයුරියගේ පණිවිඩය ගවේෂණය කරන්න සාමාජිකයින්ට ආරාධනා කරන්න. දෙවියන්වහන්සේට හා අන් අයට වඩවඩා ලං වෙන්න ආත්මයාණන්වහන්සේ කියන දේ ලියන්න සාමාජිකයින්ට කාලය දෙන්න.

**ජොයි ඩී. ජෝන්ස්,** "අප අපගේ දිව්‍ය අනන්‍යතාවය තේරුම්ගත්විට අපගේ ජීවිතවල්තුලට මොන මොන ආශීර්වාදයන් එනවාද? මේ පැනයට පිළිතුරු දෙන්න ඔබගේ ගණපූර්ණයේ හෝ සහන සමිතියේ සාමාජිකයින්ට ජොයි සොයුරියගේ පණිවිඩයෙහි ඇති මරියම, රේනු සහ ටයියන යන අයගේ කතාවන් දෙස ඒකාබද්ධව ආපසු බලන්න පුලුවන්." අපගේ දිව්‍ය අනන්‍යතාවය සිහියේ තබාගනිමින් එය අගය හදපත්ලෙන් පිළිගැනීමට අපට උපකාර වෙන්න ජෝන්ස් සොයුරිය අපට දෙන උපදෙස කුමක්ද? දෙවියන්වහන්සේ සාමාජිකයින්ව අගය කරන සැබෑ වටිනාකම සාමාජිකයින්ට තේරුම්ගන්න උපකාර කරන ශුද්ධලියවිලි කොටසක් හෝ ජෝන්ස් සොයුරියගේ පණිවිඩයේ උපුටනයක් හෝ සොයාගෙන එය සාකච්ඡා කරන්න සාමාජිකයින්ට ආරාධනා කරන්න. තමාගේ දිව්‍ය වටිනාකම ගැන සිහිකරවීම අවශ්‍ය කෙනෙක් සමඟ මේ ශුද්ධලියවිලි හෝ උපුටනයන් බෙදාගන්න ඔවුන්ට ආරාධනා කරන්න.

**ඩියෙට(ර්) එෆ්. උච්ට්ඩෝර්ෆ්**, "සොයුරියන් තුන්දෙනා"

සභාපති උච්ට්ඩෝර්ෆ්ගේ පණිවිඩය ආපසු බැලීමේ එක ක්‍රමයක් නම් ගණපූර්ණය හෝ සහන සමිතිය කුඩා කණ්ඩායම්වලට බෙදීමයි. ඔබට පුලුවන් සභාපති උච්ට්ඩෝර්ෆ්ගේ පණිවිඩයේ දක්නට ඇති සොයුරියන්ගෙන් එක්කෙනෙක් ගැන කියවන්න සෑම කණ්ඩායමකටම පවරන්න. සෑම කණ්ඩායමකටම පුලුවන් සභාපති උච්ට්ඩෝර්ෆ්ගේ උපදෙස සාරාංශ කරලා අදාල සොයුරියට ලියුමක් ලියා එසේ ලියූ දෙය අනික් කණ්ඩායම් සමඟ බෙදාගන්න. වැඩි වැඩියෙන් තුන්වෙනි සොයුරිය මෙන් ඉන්න අපට කළ හැක්කේ කුමක්ද? අපගේ ගණපූර්ණය හෝ සහන සමිතිය කරදර විඳින

අයට "ආරක්ෂිත නිවසක්" බවට පත්කරන්න අපට කළ හැක්කේ කුමක්ද?

**ඩියෙට(ර්) එෆ්. උච්ට්ඩෝර්ෆ්**, "නිවස සඳහා පුලපුලා සිටීමක්"

අනික් අයව ආශීර්වාද කරන්න දෙවියන්වහන්සේ ඔබ උගන්වන අයව භාවිතා කරන බව ඔබ උගන්වන අයට අවබෝධ කරගන්න ඔබට උදව් කළ හැක්කේ ඇති පොරොන්දු සොයමින් සභාපති උච්ට්ඩෝර්ෆ්ගේ පණිවිඩයේ ඇති "දෙවියන්වහන්සේ ඔබව භාවිතා කරයි" යන හිසින් යුත් කොටස ආපසු බලන ලෙස ඔබට පුලුවන් ඔබ උගන්වන අයට ආරාධනා කරන්න. මෙම පණිවිඩය කියවන විට දෙවියන්වහන්සේ අනුන්ව ආශීර්වාද කරන්න තමන්ව හෝ අනික් අයව භාවිතා කළ බෙදාගතහැකි අත්දැකීම් ද සාමාජිකයින්ට මතක් විය හැකිය. මෙම සාකච්ඡාව නිසා තමන් කළයුතුයි කියා දිව්‍ය ආනුභාවයෙන් තමන්ට දැනෙන දේ ගැන මෙනෙහි කරන්න සාමාජිකයින්ට කාලය දෙන්න.

**බොනි එල්. ඔස්කැර්සොන්**, "අප ඉදිරියේ තියෙන උවමනාවන්"

ඔස්කැර්සොන් සොයුරියගේ පණිවිඩය ගැන සාකච්ඡා කරන්න පටන්ගැනීමේ එක විදිහක් නම් "අද මාව කාටද ඕනේ?" කියා උඩ කෙලවරේ ලියන ලද කොලකෑල්ලක් සෑම සාමාජිකයකුටම දීමය. ගණපූර්ණයේ හෝ සහන සමිතියේ සාමාජිකයින්ට පුලුවන් මෙම පැනය ගැන මෙනෙහි කරන්න හා මෙම පැනයට පිළිතුරු වශයෙන් "අද මාව ඕන කරන අයගේ නම් මාලාවක් (ලයිස්තුවක්) සපයන්න විනාඩි කීපයක් ගතකරන්න. මෙසේ සැදුණු ලයිස්තුවේ සඳහන් අයට සේවය කරන ආකාරය පිළිබඳව අදහස් ලබාගැනීමට ඔවුන්ට පුලුවන් ඔස්කැර්සොන් සොයුරියගේ පණිවිඩය පරීක්ෂා කරන්න - නැතහොත් දේවානුභාවයෙන් මෙහෙයවනු ලැබෙන පරිදි ලයිස්තුවට නම් ඇතුලත් කරන්න ස්වල්ප දෙනෙකුට පුලුවන්. තමන් ඉගෙනගත්තු දේ බෙදාගන්න.

**ඩැලින් එච්. ඕක්ස්**, "ද ප්ලෑන් ඇන්ඩ් ද ප්‍රොක්ලමේෂන්"

නිවස තුල, සමාජය තුල හා සභාව තුල පවුල් ප්‍රකාශයනය උගන්වන්න සහ ජීවත්වන්න වැඩිහිටි ඕක්ස්ගේ ආරාධනාව ගණපූර්ණයේ සහ කණ්ඩායමේ සහ සහන සමිතියේ සාමාජිකයින් ක්‍රියා කරනු ඇත්තේ කෙසේද? එක් එක්කෙනා සමඟ අදහස් බෙදාගන්න. "වර්තමානයේ පවුලට තියෙන අභියෝගයන්වලට මුහුන දෙන්න මෙම ප්‍රකාශන උපකාරවෙන්නේ කෙසේද? වැඩිහිටි ඕක්සේග් පණිවිඩයේ IV වෙනි කොටසේ එවැනි ප්‍රකාශන ස්වල්පයක් ඇත.

**ඩී. ටොඩ් ක්‍රිස්ටොෆර්සන්,** " ස්වර්ගය සිට පැමිණි ජීවමාන පූපය"

වැඩිහිටි ක්‍රිස්ටොෆර්සන්ගේ පණිවිඩය ආපසු බලනවිට සහන සමිතියේ සහ ගණපූර්ණයේ සාමාජිකයින්ට සිතියේ තබාගතහැකි ප්‍රශ්න සමහරක් මෙසේය: ශුද්ධවන්ත බව යනු කුමක්ද? අපි ශුද්ධවන්තභාවය කරා පැමිණෙන්නේ කෙසේද? සක්‍රමේන්තුවට සහභාගිවීම අපගේ උත්සහයන් වලදී අපට උදව් වෙන්නේ කෙසේද? මෙම ප්‍රශ්නවලට පිළිතුරු දීමට ආධාර කිරීමට වැඩිහිටි ක්‍රිස්ටොෆර්සන්ගේ පණිවිඩයේ ඇති වචන සාමාජිකයින්ට සාමාජකයින් සමඟ බෙදාගත හැකිය. සාන්තුවර "සගයන් වශයෙන්" වඩා ශුද්ධවන්ත වෙන්න අප දරන වෑයම්වලදී අප එකින් එකාට උදව් කරන්නේ කෙසේද?

**ජෙෆ්රි ආර්. හොලන්ඩ්**, "එමනිසා ඔබ - යථාකාලයේදී - සම්පූර්ණව ඉන්න"

ඔබ උගන්වන සමහර අයට ගැලවුම්කරුවාණන්වහන්සේගේ ඉගැන්වීම් ජීවත්වීමේදී තමන් ශුද්ධවන්ත භාවයේ අවශ්‍ය මට්ටමට එන්නේ නැති බව දැනෙන්න පුලුවන්. මෙසේ හැඟෙන අයව සනසා ඔවුන් දිරිගන්වන්න වැඩිහිටි හොලන්ඩ් උගන්වන්නේ මොනවාද? සම්පූර්ණත්වය කරා ගමන් කරන්න "හොඳ බව අතින් තමන්ගේ වර්තමාන තත්ත්වය ප්‍රමාණවත්" යන්න පිළිගන්න අමාරුවක් දැනෙන කෙනෙකු සමඟ බෙදාගතහැකි වැඩිහිටි හොලන්ඩ්ගේ පණිවිඩයේ ඇති ඉගැන්වීමක් සොයා එය බෙදාගන්න කියා සහන සමිතියේ හෝ ගණපූර්ණයේ සාමාජිකයින්ට ආරාධනා කරන්න ඔබට පුලුවන්. නැතහොත් (ක්‍රිස්තුස්වහන්සේට) වැඩියෙන් ආදරය කරන්න හා උන්වහන්සේව වැඩියෙන් මව්තව් අගය කර උන්වහන්සේ මෙන් වීමට වැඩියෙන් ආශාකරන්න ඔවුන්ව දේවානුභාවයෙන් පොළොඹවන යමක් වැඩිහිටි හොලන්ඩ්ගේ පණිවිඩයෙන් ඔවුන්ට සොයාගතහැකිය.

**ගැරි ඊ. ස්ටීවන්සන්**, "ආධ්‍යාත්මික ග්‍රහනය"

ඔබගේ ගණපූර්ණයේ හෝ සහන සමිතියේ යම් සාමාජිකයකයෙක් හෝ සාමාජිකාවක් සූයිග්‍රහනයක් අත්දැක තියෙනවාද? එසේනම් ඔබට පුලුවන් "ආධ්‍යාත්මික ග්‍රහනය" පිළිබඳව වැඩිහිටි ස්ටීවන්සන් බෙදාගෙන ඇති උපමාව පැහැදිලි කරන්න කියා එසේ සූයිග්‍රහනයක් අත්දැක ඇති සාමාජිකයෙකුට හෝ සාමාජිකාවකට ආරාධනා කරන්න ඔබට පුලුවන්. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සහ උන්වහන්සේගේ ශුභාරංචියේ විශාලත්වයට, ප්‍රභාවට තහංචි දාන්න පුලුවන් බාධා මොනවාද?" ශුභාරංචියේ පියකරුභාවයෙන්, උනුසුමෙන් සහ ස්වර්ගීක එළියෙන් සමාජ මාධ්‍ය ජාලය අපව ඈත් කරන්නේ කෙසේද? ආධ්‍යාත්මික අන්දභාවයෙන් අපව ආරක්ෂාකරන "ශුභාරංචියේ උපැස්" අප පැළඳගන්නේ කෙසේද? ශුභාරංචි දෘෂ්ටිකෝනය තබාගෙන සිටීම සම්බන්ධයෙන් වැඩිහිටි ස්ටීවන්සන්ගේ උපමාව අපට උගන්වන්නේ කුමක්ද?

**කුයෙන්ටින් එල්. කුක්**, "සදාකාලික සැමදා"

වැඩිහිටි කුක්ගේ පණිවිඩය අපට විවිධ ආකාරවලින් බැහැපත්වීමට උත්සාහ කිරීමේ වැදගත්කම සිහිපත් කරයි. ඔහු උගන්වන දේ සාකච්ඡා කිරීමේ එක් ක්‍රමයක් නම් සාමාජිකයින්ව කොටස් දෙකකට බෙදීමයි. වැඩිහිටි කුක්ගේ පණිවිඩයේ ඇති බැහැපත්කම වර්ධනය කිරීමට අපට උදව්විය හැකි යෝජනාවල් සොයන්න කියා එක කණ්ඩායමකට කියන්න. අනික් කණ්ඩායමට කියන්න මිනිස්සු උඩඟුව පෙන්වන ආකාර සොයාබලන්න කියලා. කණ්ඩායම් දෙකටම තමන්ගේ විස්තර කිරීම අනිත් කණ්ඩායම සමඟ බෙදාගන්න ඇරයුම් කරන්න. ඒ වගේම සාමාජිකයින්ට පුලුවන් තමන්ගේ ජීවිතවල්වලදී "සැමදා බැහැපත්කම" වැඩියෙන් පෙන්වන්න ක්‍රමවල් අනික් සාමාජිකයින් සමඟ බෙදාගන්න. එලෙසම සාමාජිකයින්ට පුලුවන් මෙම බැහැපත්කම දෙවියන්වහන්සේව මුනගැහෙන්න ඔවුන්ව සූදානම් කරන්න මෙම බැහැපත්කම උදව්වෙන්නේ කෙසේද කියා සලකා බලන්න.

**රොනල්ඩ් ඒ. රස්බෑන්ඩ්,** "දෙවියන්වහන්සේගේ සිතුවම පරිදි"

වැඩිහිටි රැස්බෑන්ගේ පණිවිඩය ගැන සාකච්ඡාකරන්න දිරිගන්වන්න සාමාජිකයින් ස්වල්පදෙනෙකුට මහන රටාවක්, නිර්මාන සැලැස්මක්, කෑම වර්ගයක් හදන හැටි කියන වට්ටෝරුවක් රැගෙන ඇවිත් මේවා ඇයි ප්‍රයෝජන කියා කතා කරන්න ඔබට ඇරයුම් කළ හැකිය. සාමාජිකයින්ගේ ජීවිතවලට දෙවියන්වහන්සේ සාදා ඇති සිතුවම දැනහැඳිනගන්න වැඩිහිටි රැස්බන්ඩ්ගේ පණිවිඩයෙන් කුමන ආදර්ශ හෝ ඉගැන්වීම් ස සාමාජිකයින්ව දේවානුභාවයෙන් පොළොඹවනවාද? ඇතැම්විට පංතියේ සාමාජිකයින්ට ස්වාමීන්වහන්සේ තමන්ගේ ජීවිතවල් මෙහෙයවන බව තමන් දුටු අත්දැකීම් අන්‍යෝන්‍යාව බෙදාගන්න පුලුවන්. තමන් දෙවියන්වහන්සේගේ මෙහෙයවීම හදපත්ලෙන් හා හිසමුදුනෙන් අගය කරන බව පෙන්නුම් කරන්න ඔවුන් කර ඇත්තේ කුමක්ද?

**රසල් එම්. නෙල්සන්**, "මෝර්මන්ගේ පොත: එය නැතුව ඔබගේ ජීවිතය කුමක් වෙන්නට ගියාද?"

සභාපති නෙල්සන් ප්‍රශ්න තුනක් ගැන කල්පනා කරන්න සාමාජිකයින්ට ආරාධනා කළා. (1) "මෝර්මන්ගේ පොත නැතුව ඔබගේ ජීවිතය කුමක් වෙන්නට තිබුනාද?" (2) "ඔබ නොදැන ඉන්න ගියේ මොනවාද?" (3) "ඔබ අයිති නො කරගන්න ගියේ මොනවාද?" ඔබගේ ගණපූර්ණයේ , කණ්ඩායමේ හෝ සහන සමිතියේ සාමාජිකයින්ට ආරාධනා කරන්න මෙම ප්‍රශ්න ගැන මෙනෙහි කර තමන් ඒවාට පිළිතුරු දෙන්නේ කෙසේද කියා බෙදාගන්නා ලෙස ඇරයුම් කරන්න. දියමන්තිවලට හෝ රූබිවලට වඩා වැඩියෙන් මෝර්මන්ගේ පොත අගය කරන්න ඔවුන්ව දේවානුභාවයෙන් පොළොඹවන කුමක්ද සාමාජිකයින් මේ පණිවිඩයෙහි දකින්නේ?

**ඩේල් ජී. රෙන්ලුන්ඩ්**, "පූජකවරය හා ගැලවුම්කරුවාණන්වහන්සේගේ වන්දිගෙවීමේ බලය"
පූජකවරය ගැලවුම්කරුවාණන්වහන්සේගේ වන්දිගෙවීමේ ආශීර්වාදයන් ඔබගේ ගණපූර්ණයේ හෝ සහන සමිතියේ සාමාජිකයින්ට ලබාගැනීමට සහාය වන බව එම සාමාජිකයින්ට තේරුම්ගන්න ඔබ විසින් ඔවුන්ට උපකාර කළහැක්කේ කෙසේද? ඔබට පුලුවන් මේ ශීර්ෂ දෙක පංතියේ 'ගුරවරයා ලියන ලෑල්ලේ' ලියන්න: "අපට යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ වන්දිගෙවීම අවශ්‍ය ඇයි?" "පූජකවරය වන්දිගෙවීමේ ආශීර්වාදයන් අපට 'අත්පත්කරවන්නේ කෙසේද?" එසේ මේ ශීර්ෂ දෙක 'ගුරු ලෑල්ලේ' ලිව්වාට පස්සේ මේ එක් එක් ශීර්ෂය යට ලියන්න අදාළ වචන සමූහයන් සොයමින් වැඩිහිටි රෙන්ලුන්ගේ පණිවිඩය ගවේෂණය කරන්න සාමාජිකයින්ට ආරාධනා කරන්න.

**ඩියෙට(ර්) එෆ්. උච්ට්ඩෝර්ෆ්,** "ස්වර්ගීක එලිය දරන්නෝ"

සභාපති උච්ට්ඩෝර්ෆ්ගේ පණිවිඩය ගවේෂණය කර අපතුල දිව්‍ය එලිය තිබීම හෝ නොතිබීම අපගේ ජීවිතවල්වලට බලපාන්න පුලුවන් කෙසේද කියා හඳුනාගන්න සාමාජිකයින්ට ආරාධනා කරන්න. ඔබට පුලුවන් සභාපති උච්ට්ඩෝර්ෆ් ගෙනහැරපා ඇති ශුද්ධලියවිලිවලින් සමහරක් අධ්‍යයනය කර, ආධ්‍යාත්මික එලියට සම්බන්ධ සත්‍යතාවන් හඳුන්වාදෙන්න කියා සාමාජිකයින්ට ආරාධනා කරන්න. ආධ්‍යාත්මික එලිය සෙවීමේදී නිදහස් කැමැත්තේ කායිභාරය ගැන සූයිග්‍රහනයේ උපමේය අපට උගන්වන්නේ කුමක්ද? අනික් අය සමඟ, විශේෂයෙන් අපගේ පවුල් සමඟ හා "එලිය සොයන අපගේ තරුණයන් සමඟ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ දිව්‍ය එලිය බෙදාගන්න අපට කළහැක්කේ කුමක්ද?

**හෙන්රි බී. අයිරිං,** "ස්වාමීන්වහන්සේ උන්වහන්සේගේ සභාව මෙහෙයවනසේක"

තමන්ගේ හෝ අනික් කෙනෙකුගේ කැඳවීම දෙවියන්වහන්සේගෙන් ආ බව අදහන්නාවූ ඔවුන්ගේ ඇදහිල්ල වර්ධනය කිරීමට ඔවුන්ට අවශ්‍යවූ අත්දැකීම් බෙදාගන්න කියා ගණපූර්ණයේ සාමාජිකයින්ට හෝ සහන සමිතියේ සාමාජිකාවන්ට ආරාධනා කරන්න. ඔවුන් ඔවුන්ගේ ඇදහිල්ල අභ්‍යාස කළේ කෙසේද? ඔවුන්ට කැඳවීම ලැබුනේ දෙවියන්වහන්සේගෙන් කියා ඔවුන් ඉගෙනගත්තේ කෙසේද? සභාපති අයිරිංගේ පණිවිඩය ගවේෂණය කර, ස්වාමීන්වහන්සේ කැඳවා ඇති අප හා ස්වාමීන්වහන්සේ කැඳවා ඇති අනික් අය අප විශ්වාස කර අප සම්බන්ධයෙන් හා ඔවුන් සම්බන්ධයෙන් අප ඉවසීමෙන් ඉන්න අපට උදව් විය හැකි, සභාපති අයිරිං තමාගේ පෞද්ගලික අත්දැකීමෙන් ඉගෙනගත් සත්‍යතාවයන් හඳුනාගන්න සාමාජිකයින්ට ආරාධනා කරන්න.

**ජීන් බී. බිංහෑම්,** "ඔබගේ ප්‍රීතිය පිරිපුන් වන ලෙස"

අප ක්‍රිස්තුස්වහන්සේ වෙත එන විට, ජීවිතයේ කම්කටොලු තිබුනත් ප්‍රීතිය අත්පත්කරගන්නේ කෙසේද කියා ඔබගේ සහන සමිතියේ සාමාජිකාවන්ට හෝ ගණපූර්ණයේ සාමාජිකයින්ට තේරුම්ගන්න බ්‍රිගෑම් සොයුරියගේ පණිවිඩය උපකාර විය හැකිය. ඇයගේ පණිවිඩය සාකච්ඡාකිරීමට එක් ක්‍රමයක් නම් ගුරුලෑල්ලේ (වයිට් බෝර්ඩ්) ප්‍රීතිය යන වචනය කරා යන පාරක් ඇඳීමයි. සැබෑ ප්‍රීතිය කරා අපව ගෙනයන බ්‍රිගෑම් සොයුරියගේ පණිවිඩයේ ඇති යෝජනාවක් ගුරුලෑල්ලේ (වයිට් බෝර්ඩ්) අඳින ලද පාරේ ලියන්න කියා සාමාජිකයින් කීපදෙනෙකුට ආරාධනා කරන්න. බ්‍රිගෑම් සොයුරියගේ උපදෙස් මත ක්‍රියා කළ හැකි ආකාරයන් සලකා බලන්න සාමාජිකයින් දිරිගන්වන්න. සාමාජිකයින් කීපදෙනෙකුට තමන්ගේ සිතුවිලි බෙදාගන්න ආරාධනා කරන්න.

**ඩේවිඩ් ඒ. බෙඩ්නාර්,** "අතිශයින් මහත් හා අගනා පොරොන්දු"

ඔබගේ සහන සමිතියේ සාමාජිකාවන්ට හෝ ගණපූර්ණයේ සාමාජිකයින්ට වැඩිහිටි බෙඩ්නාර්ගේ පණිවිඩය සාකච්ඡාකරන්න ඔබට පුලුවන් සබත් දවස, දේවමාලිගාව සහ අපගේ නිවෙස් නියෝජනය කරන චිත්‍ර ගුරුලෑල්ලේ (වයිට් බෝර්ඩ්) ප්‍රදර්ශනය කරන්න. සාමාජිකයින්ට ආරාධනා කරන්න වැඩිහිටි බෙඩ්නාර්ගේ පණිවිඩයේ අදාල කොටස් කියවා, සබත් දිනය, දේවමාලිගාව සහ අපගේ නිවෙස් දෙවියන්වහන්සේ අපට දී ඇති පොරොන්දු වෙත අපගේ අවධානය යොමුකරන්න උදව් කරන්නේ කෙසේද කියා

ගුරුලෑල්ලේ (වයිට් බෝර්ඩ්) ලියන්න කියා. අපගේ ජීවිතවල්වල තියෙන කුමන දේවල් මෙම පොරොන්දු වලින් අපව ඈත් කරනු ඇත්ද? එම පොරොන්දු සිහියේ තබාගන්න අපට ගතහැකි පියවරයන් මොනවාද?

**හෙන්රි බී. අයිරිං**, "හොඳ දේ කරන්න බිය වන්න එපා"
සභාපති අයිරිංගේ පණිවිඩය ඔබ උගන්වන අයට ලෝකයෙහි හොඳ දෙය කරන්න දිරිය හා ඇදහිල්ල අත්පත්කරගන්න උපකාර විය හැක. සභාපති අයිරිං අප සමඟ බෙදාගනිමින් එළිදරව් කර ඇති සැදැහැවතුන්ගේ ආදර්ශයන් සාරාංශ කර කියන්න කියා ඔබට පුලුවන් සාමාජිකයින් ස්වල්පදෙනෙකුට ආරාධනා කරන්න. අනික් අයට සේවය කිරීම සම්බන්ධයෙන් මෙම ආදර්ශ අපට උගන්වන්නේ කුමක්ද? ගණපූර්ණයක් වශයෙන් හෝ සහන සමිතියක් වශයෙන් හෝ අපට සේවය කළ හැකි ආකාරයන් පිළිබඳව මෙම ආදර්ශ අපට යෝජනා කරන්නේ කුමක්ද? මොර්මන්ගේ පොත අධ්‍යයනය කරන ලෙස සභාපති තොමස් එස්. මොන්සන් දුන් උපදෙස පිළිපැදීමෙහි සභාපති අයිරිං දුටු ආශීර්වාදයන් පුනරීක්ෂණය කිරීම සභාපති අයිරිංගේ අදාළ පණිවිඩය සාකච්ඡාකිරීමේ තවත් ක්‍රමයකි. මෝර්මන්ගේ පොත අධ්‍යයනය කිරීමෙන් අප දැක ඇති ආශීර්වාදයන් මොනවාද?

**එම්. රසල් බැලර්ඩ්**, "ගමන දිගටම සිදුවෙයි!"
වැඩිහිටි බැලර්ඩ්ගේ පණිවිඩය සාකච්ඡාකරන්න පටන්ගන්න, ඔබට පුලුවන් ගමනාන්තයක් ගැන තීරණයක් ගෙන එය කරා තමන් යමින් සිටිනවා යයි සිතූ කණ්ඩායමක් තමන් වැරදි ගමන්මගේ සිටින බව දැනගත්විට ඔවුන් අත්දුටු අත්දැකීම බෙදාගන්න කෙනෙකුට ආරාධනා කරන්න. මෙවැනි උදාහරණ ස්වර්ගීක පියාණන්වහන්සේ වෙත අප ආපසු යෑමේ අපගේ පෞද්ගලික "ගමන" හා සැසඳෙන්නේ කොහොමද? අප අපගේ පෞද්ගලික ජීවිතවල්වලදී අප හරි දිසාවට යොමු වෙලා තියෙනවාද කියලා දැනගන්න අපට උදව් කළ හැකි උපදෙස් හා අවවාද වැඩිහිටි බැලර්ඩ්ගේ පණිවිඩයෙහි සොයන්න සාමාජිකයින්ට පුලුවන්. සාමාජිකයින්ට තමන්ගේ ගමන්මග ගැන මෙනෙහි කරන්න හා අපට අනික් අයට



ඔවුන්ගේ ස්වර්ගීක පියාණන්වහන්සේ කරා ආපසු යෑමේ "ගමනෙහි" උදව් කළ හැකි හා ඔවුන් දිරිගැන්විය හැකි ක්‍රම සාකච්ඡා කරන්න කාලය දෙන්න.

**නීල් එල්. ඇන්ඩර්සන්**, "ස්වාමින්වහන්සේගේ හඬ"
ඇතැම්විට ඔබගේ සහන සමිතියේ සාමාජිකාවන්ට හෝ ගණපූර්ණයේ සාමාජිකයින්ට පුලුවන් තමන්ට ප්‍රධාන සම්මන්ත්‍රණ පණිවිඩයක් විශේෂයෙන් අර්ථවත් වූ අත්දැකීමක් බෙදාගත හැකිය. මේ පණිවිඩවල් අර්ථවත් වූයේ ඇයි? ප්‍රධාන සම්මන්ත්‍රණ පණිවිඩවල විශේෂත්වය ගැන හා ඒවා සූදානම් කිරීමේදී දරනුලබන උත්සාහයන් හා ඒවායේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් වැඩිහිටි ඇන්ඩර්සන් උගන්වන්නේ මොකක්ද? මේ දේවල් දැනසිටීම අප මේ වචන අධ්‍යයනය කිරීම සහ ඒවා සැලකිල්ලට ලක්කිරීම උනන්දුවෙන් කිරීම කෙරෙහි බලපාන්නේ කෙසේද? මෑතම සම්මන්ත්‍රණයේ සිට ආරාධනාවල්වල ලයිස්තුවක් සෑදීම සලකා බලන්න. මෙම ආරාධනාවල් සම්බන්ධයෙන් අප කර ඇත්තේ කුමක්ද?

## හතරවෙනි-ඉරිදා රැස්වීම්

සෑම මාසයේම හතර වෙනි ඉරිදා, ගණපූර්ණයන්, කණ්ඩායම් සහ සහන සමිති පළවෙනි සභාපතිත්වය හා ප්‍රේරිතයින් දොළොස්දෙනා විසින් තෝරනලද මාතෘකාවක් ගැන සාකච්ඡා කරති. මේ මාතෘකා සෑම ප්‍රධාන සම්මන්ත්‍රණයත් සමඟම යාවත්කාලීන කරනු ලැබෙයි. මාතෘකාව ඊළඟ ප්‍රධාන සම්මන්ත්‍රණය තෙක් සබත් දිනය වෙයි. නායකයින්ට හෝ ගුරුවරුන්ට පුලුවන් පහත දක්වා ඇති දහම්වලින් සහ ක්‍රියාකාරකම්වලින් තමන්ගේ තේරීම කරන්න; එමෙන්ම ඒවා කීපයක් ඒකාබද්ධ කරන්න හෝ සාමාජිකයින්ගේ අවශ්‍යතාවයන් පරිදි තමන්ගේ මාතෘකා නිර්මාණය කරන්නද නායකයින්ට හා ගුරුවරුන්ට පුලුවන්.

**සබත් දවස දෙවියන්වහන්සේ අපට කර ඇති දේ සිහිකරන දවසයි.**

ඉතිහාසයේ මුලුල්ලේ, දෙවියන්වහන්සේ ඇතැම් ප්‍රතාපවත් වැඩවල් සබත් දවස හා ආශ්‍රිත කර ඇති සේක. මේ ප්‍රතාපවත් වැඩවල් අතර මැවිල්ල (උත්පත්ති 2: 1–3 බලන්න), ඊජිප්තුවෙන් ඊශ්‍රායෙල් දරුවන් නික්මයාම (ද්විතිය කථාව 5: 15 බලන්න), සහ ගැලවුම්කරුවාණන්වහන්සේගේ උත්ථානය (යොහන් 20:1–19 ; ක්‍රියා 20:7 බලන්න). මේ කොටස් පුනරීක්ෂණය කර මේ හැම සිද්ධියක්ම සිහිකිරීම අපට සබත් දිනය ගරු කරන්න කෙසේ උපකාර කරන්න පුලුවන්ද කියා සාකච්ඡා කරන්න ආරාධනා කරන්න. දෙවියන්වහන්සේ අප වෙනුවෙන් කර ඇති ප්‍රතාපවත් වැඩවල් සමහරක් මොනවාද? අපට මේ දේවල් සබත් දිනයේදි සිහිකළ හැක්කේ කෙසේද? අදාල පරිදි මෙවැනි ප්‍රශ්න තමන්ගේ පවුල්වලදී සාකච්ඡා කරන්න සාමාජිකයින්ට ආරාධනා කරන්න.

**යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සබත් දවසේද ස්වාමියාය.**

සබත් දවස ස්වාමීන්වහන්සේගේ දවස යයි ද කියනු ලැබේ (එළිදරව්ව 1:10 බලන්න). යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සබත් දවසේ ස්වාමියායයි කියනුලබන්නේ ඇයි? (මතෙව් 12:8 ). සාමාජිකයින්ට තමන්ගේ සබත් දවසේ අත්දැකීම් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මත කේන්ද්‍ර කිරීමේ ක්‍රම දේවානුභාවයෙන් සිතීමට උපකාර විය හැකි වගන්ති ස්වල්පයක් ගැන ඒකාබද්ධව පුනරීක්ෂණය කරන්න (උදාහරණ වශයෙන්, හිලමන් 5:12 ; ඊතර් 12:41 ; මොරොනි 10:32 ; සහ ද.හා.ගි. 6:36–37). සාමාජිකයින් විසින් සබත් දවස වඩාත් ක්‍රිස්තු කේන්ද්‍රකරන්න උදව් විය හැකි අනික් වගන්ති මොනවාද? සබත් දිනය මුලුල්ලේ ගැලවුම්කරුවාණන්වහන්සේ කෙරෙහි අවධානය යොමු කරන්න අපට උදව් වීමට අප විසින් පිහිටුවාගත හැකි අරමුණු මොනවාද?

**සබත් දවස ගරුකිරීමෙහි අපගේ ආදර්ශය යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ය.**

උන්වහන්සේගේ මැරෙනසුලු මෙහෙවරයේදී, සබත් දවස ගැන උගන්වන්ට ගැලවුම්කරුවාණන්වහන්සේ අවස්ථා යොදාගත්සේක. පහත සඳහන් විස්තර කියවා, සබත් දවස යේසුස්වහන්සේ කළ දේවල්වල හා උන්වහන්සේ ඒ දේවල් තුලින් ඉගැන්වූ මූලධර්මවල ලයිස්තුවක් හදන්න සාමාජිකයින්ට කියන්න: ලූක් 6:1–11 ; 13:11–17 ; යොහන් 5:1–20 ; 9:1–16. පහත සඳහන් වගන්තිවලින් සබත් දවස පිළිබඳව අප ඉගෙන ගන්නාවූ අනික් මූලධර්ම මොනවාද? නික්මයාම 20:8–11 ; 31:12–18 ; යෙසායා 58:13–14 ; සහ ද.හා.ගි. 59:9–19. ගැලවුම්කරුවාණන්වහන්සේගේ ආදර්ශය අනුගමනය කරන්න තමන්ට කළහැක්කේ මොනවාදැයි බෙදාගන්න සාමාජිකයින්ට ආරාධනා කරන්න.

රසල් එම්. නෙල්සන්, “සබත් දවස සතුටක්”, එන්සයින් හෝ ලියහෝනා, මැයි 2015, 129–32.

**සබත් දවස වන්දනා කිරීමේ දවසක්**

“වන්දනාව” යන වචනය ලියා සාමාජිකයින්ට කියන්න එයට ලඟින් ආශ්‍රිත අනික් වචන ලියන්න. දැන් තීරු තුනක් හදා ඒ තීරු උඩ කෙලවරේ පිළිවෙලින් “පෙර”, “අතරතුර” හා “පසු” යන වචන ලියන්න . උන්වහන්සේගේ ශුද්ධවූ දවසේදී පල්ලියට “පෙර”, “අතරතුර”, හා “පසුව” ස්වාමීන්වහන්සේට වන්දනා කරන්න අපට කරන්න පුලුවන් දේවල් මොනවාද? මේ සම්බන්ධයෙන් අදහස් සඳහා ඒකාබද්ධව සාමාජිකයින්ට පුලුවන් මොසායා 18:17–29 සහ මොරෝනි 6 කියවන්න. සබත් දවසේදී ස්වාමීන්වහන්සේට වන්දනාකරන්න තමන්ගේ ආකල්ප හා ක්‍රියාවන් තමන්ට උදව් වෙන්නේ කෙසේද කියා මෙනෙහි කරන්න සාමාජිකයින්ට ආරාධනා කරන්න. (නික්මයාම 31:16–17 බලන්න). පල්ලියේ රැස්වීම්වලදී අපගේ පවුල් හා ශාඛා (කොට්ඨාශ) සාමාජිකයින් අත්දකින වන්දනා අත්දැකීම් දියුණුකරන්න සහාය වන්න අපට කළ හැකි දෙවල් මොනවාද?

**සක්‍රමේන්තුවට සහභාගිවීම අපට සෑමවිටම ආත්මයාණන්වහන්සේව අප සමඟ තබාගැනීමට ඉඩ දෙයි.**

පහත සඳහන් ප්‍රශ්නය ගුරුලෑල්ලේ (වයිට් බෝර්ඩ්) ලියන්න: සක්‍රමේන්තුව ඔබගේ ජීවිතයට බලපාන්නේ කෙසේද? මෙම ප්‍රශ්නයට පිළිතුරු දෙන්න, සාමාජිකයින්ට ආරාධනා කරන්න දෙදෙනා බැගින් වැඩ කර දහම හා ගිවිසුමේ 22:77,79 හි ඇති සක්‍රමේන්තු යාච්ඤාවන් වලින් එක වචන සමූහයක් තෝරා ගෙන එය හා දහම හා ගිවිසුම 59:9 හි සඳහන් උපදෙස් සාකච්ඡා කරන්න. තමන්ගේ වචන සමූහය වඩා හොඳින් තේරුම්ගන්න ඔවුන්ට සහාය වන ශුද්ධලියවිලි කොටස් සොයාගන්න සහ ඔවුන් ප්‍රශ්නයට ගුරුලෑල්ලේ (වයිට් බෝර්ඩ්) පිළිතුරු සපයන්නේ කෙසේද කියා සාකච්ඡා කරන්න සෑම දෙදෙනාටම කාලය දෙන්න. තමන් විශේෂයෙන් කැමති සක්‍රමේන්තු ගීතිකාවක් තෝරාගෙන එය ඒකාබද්ධව ගයන්න කියා පංතියේ සාමාජිකාවන්ට ආරාධනා කරන්නට ද ඔබට පුලුවන්. (වෙරිල් ඒ. එස්ප්ලින්, “සක්‍රමේන්තුව -- ආත්මයේ අලුත්වීමක්”, එන්සයින් හෝ ලියහෝනා, නොවැ. බලන්න 2014, 12–14.

**සබත් දවස අනික් අයට සේවය කිරීමේ දවසක්.**

ගැලවුම්කරුවාණන්වහන්සේ උන්වහන්සේ අවට සිටි අයට සේවය කළ හා ආශීර්වාද කළ විදිහවලින් සබත් දවසේදී අන් අයට සේවය කිරීම සම්බන්ධයෙන් අපට ඉගෙන ගතහැක්කේ කුමක්ද? මතෙව් 9:10–13 ; ලූක් 19:1–9 ; යොහන් 11:32–46 ; 13:1–5, 12–17 ; සහ 3 නෙපි 17:5–10 ආපසු බලා සාකච්ඡා කරන්න සාමාජිකයින්ට ආරාධනා කරන්න. සබත් දවසේදී තමන්ට සේවය කළ හැක්කේ කෙසේද කියා සලකාබැලීමේදී මෙම ශුද්ධලියවිලි කොටස් ගැන සිතන්න කියා සාමාජිකයින්ට කියන්න. උදාහරණ වශයෙන් ඔවුන්ට පුලුවන් පවුලේ සාමාජිකයින්ට සේවය කරන්න, තවද, තමන් නිවෙස් සහ බැහැදැකීම් ගුරුවරු වශයෙන්, පුද්ගලයින් වෙත හෝ පවුල් වෙත යා හැකිය, පවුල් ඉතිහාසය සම්බන්ධයෙන් වැඩ කළ හැකිය, අසනිප අය බැහැදැකිය හැකිය, එසේ නැත්නම් ශුභාරංචිය බෙදාගතහැකිය. සමහරවිට අන් අයට සබත් දවසේදී සේවය කිරීමේ ක්‍රම සැලසුම් කරන්න සාමාජිකයින්ට පුලුවන් පවුල් මන්ත්‍රණසභාවක් පවත්වන්න.

